# 01
# නීතිය හා යුක්තිය

**හැඳින්වීම**

සමාජයේ යහපැවැත්ම ආරක්ෂා කර ගැනීම පුරවැසියන් වන අප සැමගේ වගකීම වේ. නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් නොවන්නේය යන මූලධර්මයට අනුව සැම දෙනාම නීතිය පිළිබඳ ව අවබෝධයක් ලබා තිබීමේ අවශ්‍යතාව පැහැදිලි වේ. මෙම පරිච්ඡේදය මඟින් ද අපේක්ෂා කරනුයේ නීතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීමයි. ඒ සඳහා නීතිය හා යුක්තිය, විවිධ නීති වර්ග, අධිකරණ පද්ධති, ආරවුල් විසඳීමේ ක්‍රම හා නීතියේ ආධිපත්‍ය යන කරුණු සාකච්ඡාවට ලක් කරනු ලැබේ.

## නීතිය නිර්වචනය කිරීම හා හැඳින්වීම

නීතිය යනු යම් රටක් හෝ ප්‍රජාවක් විධිමත් මිනිස් හැසිරීම් හා ක්‍රියාකාරකම් පාලනය කිරීම හා සමාජ යහ පැවැත්ම උදෙසා අනුගමනය කළ යුතු බවට පනවනු ලබන රීති පද්ධතියක් ලෙස සරල ව විග්‍රහ කළ හැකි ය. විවිධ චින්තකයින් විසින් 'නීතිය' විවිධාකාරයෙන් අර්ථකථනය කරනු ලැබීමට උත්සුක වූ අයුරු දැකිය හැකිය.

ඒ අතුරින් ග්‍රීන් හා ජෝන් ඔස්ටින් දක්වා ඇති නිර්වචන පහත දැක්වේ.

නීතිය යනු රාජ්‍යය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ පද්ධතියකි. ටී.එච්. ග්‍රීන් **(T.H. Green)**

නීතිය යනු පරමාධිපත්‍ය දේශපාලන අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන ආඥාවක් වන අතර එය කඩ කිරීම දඬුවමට හේතු වේ. ජෝන් ඔස්ටින් **(John Austin)**

සැම සමාජයක්ම නීතියට අනුව පාලනය කළ යුතු වේ. නීතියට ගරු කිරීම හා අවනත වීම පුරවැසියන්ගේ වගකීමයි. නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වන සමාජයක යුක්තිය, සාමය හා සුරක්ෂිතභාවය යන ලක්ෂණ දක්නට ලැබේ. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මහජනතාවගේ ජීවිත, අයිතිවාසිකම් හා දේපළ ආරක්ෂා වන අයුරින් මානව හැසිරීම් පාලනය කිරීම තුළින් යුක්තිය ඇති කිරීමයි.

නීතිය හා බැඳුණු අනෙක් සංකල්පය වන්නේ යුක්තියයි. යුක්තිය යන්න සාධාරණ හැසිරීම හෝ සැලකුම ලෙස කෙටියෙන් විග්‍රහ කළ හැකි ය. අපක්ෂපාතී ව සියලු ම පාර්ශ්වයන්ට මැනවින් සවන් දී නීතිය ක්‍රියාවට නැංවීම මගින් යුක්තිය ඉටු වේ.

නීතිය ක්‍රියාත්මක කිරීම යුක්ති සහගත ව හා සර්ව සාධාරණ ව සිදුවිය යුතු වේ. කිසියම් රටක නීතිය මැනවින් ක්‍රියාත්මක වන විටෙක සමාජය නීති ගරුක වන අතර ජනතාව තුළ නීතිය කෙරෙහි විශ්වාසය තහවුරු වීමක් ද සිදු වේ. එමගින් යුක්ති ගරුක සාධාරණ සමාජයක් බිහි වේ.

යුක්තිය ඇති කිරීම පිළිබඳ ව පහත සඳහන් කරුණු ඉතා වැදගත් වේ.

- තමාට ඉදිරිපත් ව ඇති චෝදනා පිළිබඳ ව දැන ගැනීමට ඇති අයිතිය
- තමා වෙනුවෙන් අධිකරණය ඉදිරියේ තමා ම පෙනී සිටීමට හෝ නීතිඥයෙකු මඟින් කරුණු කීමට ඇති අයිතිය
- සාධාරණ හා අපක්ෂපාතී විනිශ්චයක් ලබා ගැනීමට තිබෙන අයිතිය

## නීතියේ ගුණාංග

සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන විය යුතු අතර නීතියේ ආරක්ෂාවරණය සඳහා අයිතිවාසිකම් ලබති. දියුණු නීති පද්ධතීන් තිබෙන ශිෂ්ට සම්පන්න සමාජවල පවතින අත්‍යවශ්‍ය ගුණාංග කිහිපයක් අපට හඳුනාගත හැකි ය.

- අධිකාරි බලය පදනම් කරගෙන රාජ්‍ය විසින් ම පනවන්නක් වීම
- මිනිස් ක්‍රියාකාරකම් හා චර්යාවන් පාලනය කිරීමේ අරමුණින් පනවන්නක් වීම
- යුක්ති සහගත හා සාධාරණ විය යුතු වීම
- පොදු සමාජ යහපත අරමුණු කොට ගෙන පැනවිය යුතු වීම
- වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වීම
- නිරවුල් ව හා පැහැදිලි ව දැක්විය යුතු වීම
- නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම

## නීතියේ මූලාශ්‍ර

නීතිය ආරම්භ වීමට බලපාන සාධක හෝ නීතිය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි ආකාරයන් නීතියේ මූලාශ්‍ර ලෙස සඳහන් කළ හැකි ය. එවැනි මූලාශ්‍ර කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | - | රාජ්‍යයක උත්තරීතර නීතිය වන්නේ එම රටෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. |
| 2. විවිධ අණ පනත් | - | පාර්ලිමේන්තුව මඟින් සම්මත කරනු ලබන විවිධ අණ පනත් නීති මූලාශ්‍ර ලෙස යොදා ගැනේ. |
| 3. අධිකරණ තීන්දු | - | ඉහළ අධිකරණ විසින් දෙන ලද නඩු තීන්දු පසුකාලීන නඩු තීන්දු සඳහා භාවිත කෙරේ |
| 4. නීති විශාරදයන්ගේ මත හා විද්‍යාත්මක සිද්ධාන්ත | - | නීති විශාරදයන් විසින් පවතින නීතිය අධ්‍යයනය කරමින් ඉදිරිපත් කරන විවිධ අදහස්, නීති විද්‍යාත්මක සිද්ධාන්ත ලෙස සැලකේ. |
| 5. සිරිත් විරිත් | - | සමාජය පිළිගත් මැනවින් ස්ථාපිතව පවතින විවිධ සිරිත් විරිත් චාරිත්‍රානුකූල නීතිය ලෙස හැඳින්වේ. |
| 6. ආගම | - | විවිධ ආගම් පදනම් කරගෙන නීති සකස් වී තිබේ. මුස්ලිම් නීතිය, විහාර හා දේවාලගම් පිළිබඳ නීතිය. |

## නීති වර්ග

නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව දේශීය නීතිය හා අන්තර්ජාතික නීතිය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.


## දේශීය නීති

යම් රටක් තම දේශ සීමාව තුළ බල පැවැත්වෙන පරිදි පනවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන නීතියයි. රටේ අවශ්‍යතාව අනුව නීති පනවන බැවින් දේශීය නීතිය රටකින් රටකට වෙනස් වේ. දේශීය නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, අපරාධ නීතිය හා සිවිල් නීතිය වශයෙන් වෙන්කොට හඳුනාගත හැකි ය. පහත වගුවෙන් එය පැහැදිලි කර ඇත.

අපරාධ නීතිය හා සිවිල් නීතිය අතර ඇති ප්‍රධාන වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

| අපරාධ නීතිය | සිවිල් නීතිය |
|---|---|
| • යම් පුද්ගලයෙකු වෙනත් පුද්ගලයෙකුගේ ජීවිතයට හෝ දේපලවලට හානි සිදු කළ විට අපරාධ නීතිය ක්‍රියාත්මක වේ. | • පුද්ගලික පාර්ශ්වයන් අතර ඇතිවන ආරවුල් නිරාකරණය සඳහා වූ නීතියයි. |
| • අපරාධ නීතියේ විවිධ ශාඛා දක්නට නොලැබේ. එහෙත් බරපතල අපරාධ සහ සුළු අපරාධ වශයෙන් වර්ග කරයි. | • සිවිල් නීතියේ විවිධ ශාඛා දක්නට ලැබේ. උදා:- ගිවිසුම් නීතිය, ව්‍යාපාර නීතිය, පවුල් නීතිය වැනි. |
| • අපරාධ සම්බන්ධ විශේෂ දඬුවම් පනවනු ලබයි. උදා:- දේපල රාජ සන්තක කිරීම, මරණ දඬුවම, සිරගත කිරීම. | • සිවිල් වැරදි සම්බන්ධව වන්දි ගෙවීම, දඩ ගැසීම වැනි දඬුවම් පැනවීම. |
| • අපරාධ සම්බන්ධව 1979 අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 1833 දණ්ඩ නීති සංග්‍රහය ප්‍රධාන වේ. | • සිවිල් නීතිය සම්බන්ධ සිවිල් නඩු විධාන සංග්‍රහය ප්‍රධාන වේ. |
| • අපරාධ නීතියේ දී දඬුවම් පැමිණවීම සහ පුනරුත්ථාපනය කිරීමට ප්‍රමුඛතාව දක්වයි. | • සිවිල් නීතියේ දී හානි පූරණය හා යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රමුඛතාව දක්වයි. |
| • අපරාධ නීතිය යටතේ පොලිසිය හෝ නීතිපති දෙපාර්තමේන්තුව පැමිණිල්ල ඉදිරිපත් කරයි. | • සිවිල් නඩුවක දී ආරවුලට සම්බන්ධ පුද්ගලික පාර්ශ්වයන් පැමිණිල්ල ඉදිරිපත් කරයි. |

අපරාධ නීතියට අනුව රාජ්‍ය විරෝධී ක්‍රියා, මහජන සාමය කඩ වීමට බලපාන ක්‍රියා, මරණය සිදු කිරීම, මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පීඩා ඇති කිරීම, තුවාල කිරීම, ලිංගික අපරාධ, ස්ත්‍රී දූෂණය, පොදු දේපලවලට හානි කිරීම, දේපල සොරකම් කිරීම, කොල්ල කෑම, සොරබඩු ළඟ තබා ගැනීම, මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම හා අළෙවිය ආදිය දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි ලෙස සැලකේ.




1.1 රූපසටහන - දේශීය නීතියේ ප්‍රභේද

## අන්තර්ජාතික නීතිය

රටවල් අතර සම්බන්ධතා, රාජ්‍යයන් හා අන්තර්ජාතික සංවිධාන මෙන් ම ඇතැම් අවස්ථාවල දී රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් හා පුද්ගලයන් ද පාලනය කරනු ලබන නීතිය අන්තර්ජාතික නීතිය ලෙස ස්ටාර්ක් දක්වා තිබේ. එක් රටක් වෙනත් රටවල් සමඟ පවත්වන සම්බන්ධතා අන්තර්ජාතික නීතිය මඟින් පාලනය වේ. වර්තමානය වන විට අන්තර්ජාතික නීතිය ඇසුරෙන් පැන නැගුණු නීති ශාඛා බොහොමයක් පවතී. නිදසුන් ලෙස අන්තර්ජාතික මානව හිමිකම් නීතිය, පරිසර නීතිය, ආයෝජන නීතිය, සාගර නීතිය දක්විය හැකි ය. අන්තර්ජාතික යුක්ති අධිකරණය, අන්තර්ජාතික අපරාධ අධිකරණය මෙබඳු අන්තර්ජාතික නීති බලාත්මක කිරීමේ වැදගත් කාර්යයක් ඉටු කරයි.

## ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති පද්ධතිය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ රෝම ලන්දේසි නීතියයි. මීට අමතර ව වෙනත් විශේෂ නීති වර්ග කිහිපයක් ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ.

### 1. උඩරට නීතිය

අතීත ශ්‍රී ලංකාවේ උඩරට රාජධානියේ ක්‍රියාත්මක වූ නීතිය උඩරට නීතිය නම් වේ. ඉංග්‍රීසි යුගයේ දී මෙම නීතිය උඩරට ප්‍රදේශයෙහි ජීවත් වූ සිංහලයන්ට පමණක් සීමා විය. වර්තමානයේ දී ද උඩරට සිංහලයන්ගේ විවාහය, දික්කසාදය, දේපළ උරුමය වැනි

කරුණු උඩරට නීතිය මඟින් පාලනය වේ. අවශ්‍ය නම් උඩරට සිංහලයන්ට මෙම විශේෂ නීතිය මඟින් නොව රටේ අන් සැමට බලපාන පොදු නීතිය අනුව පාලනය වීම තෝරා ගත හැකි ය.

**2. තේසවලාමේ නීතිය**

තේසවලාමේ යන්නෙහි අර්ථය ''භූමියේ චාරිත්‍රය'' යන්නයි. උතුරු පළාතේ පදිංචි දෙමළ වැසියන්ගේ චාරිත්‍ර මත මෙම නීතිය ආරම්භ වී තිබේ. 1706 දී මෙම චාරිත්‍ර එකතු කොට නීති පද්ධතියක් ලෙස පිළියෙල කරන ලදි. වර්තමානයේ මෙම නීතිය උතුරු පළාතේ හා මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචි දෙමළ වැසියන්ට සීමා වී තිබේ. මෙම නීතිය මඟින් ඔවුන්ගේ උරුම අයිතිවාසිකම්, දේපළ පිළිබඳ කරුණු පාලනය වේ.

**3. මුස්ලිම් නීතිය**

ඉස්ලාම් ධර්මය අදහන ඕනෑ ම අයෙකුට මුස්ලිම් නීතිය අදාළ වේ. මෙම නීතියේ මූලාශ්‍රයන් ලෙස අල්-කුර් ආනය, අල්-හදීස්/සුන්නාස්, ඉජ්මා හා කියාස් වැනි ලේඛන සැලකේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ 1806 දී සකස් කළ මොහොමදියානු නීති සංග්‍රහයයි. උදාඃ- මුස්ලිම් විවාහ හා දික්කසාද, උරුම අයිතිවාසිකම්, නඩත්තු වැනි කරුණු මෙම නීතියට අදාළ වේ. 1929 දී මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම සඳහා පළමු වරට කාති උසාවි පිහිටුවන ලදි.

රාජ්‍යයක වගකීම වන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වා ගනිමින් යහපත් සමාජයක් ගොඩනැංවීමයි. ඒ සඳහා රට තුළ ඇතිවන විවිධ අර්බුද ගැටලු හා නීතිය කඩ කිරීම්වල දී දේශීය නීතියට අනුව කටයුතු කිරීම අවශ්‍යය. එමෙන් ම වෙනත් රාජ්‍යයන් සමඟ කටයුතු කිරීමේ දී අන්තර්ජාතික නීතියට අනුව ක්‍රියාකරමින් තම රටට ගෞරවනීය තත්ත්වයක් ඇති කර දීම වැදගත් වේ.

**ක්‍රියාකාරකම්**

- නීතිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?
- රටකට නීතියක් අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.
- ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශේෂ නීති කෙටියෙන් විග්‍රහ කරන්න.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

# ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය

## අධිකරණ පද්ධතියේ ඓතිහාසික විකාශය

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ විකාශය ගැන විමසීමේ දී එය රාජාණ්ඩු සමය දක්වා ම විහිදෙන බව පැහැදිලි ය. රජතුමා ඉහළ ම අධිකරණ නිලධාරියා වූ අතර ලිඛිත නීති පද්ධතියක් යටතේ අධිකරණය ක්‍රියාත්මක විය. රාජකීය අධිකරණ පද්ධතියේ අවසාන අභියාචනාකරු වූයේ ද රජතුමා ම වේ.



1.1 රූපය - පෙර රජවරුන් නඩු විසඳූ මහනුවර මගුල්මඩුව

පෘතුගීසීන් විසින් පැරණි සිංහල අධිකරණ ක්‍රමයට පවත්වාගෙන යනු ලැබී ය. විදනේ කෝරාල හා දිසාවේ විසින් අධිකරණ බලය ක්‍රියාත්මක කළ අතර ගම් සභා ක්‍රමය ද දිගටම පවත්වා ගෙන යනු ලැබී ය. ලන්දේසි යුගයේ දී කොළඹ, යාපනය, ගාල්ල යනුවෙන් ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුනක් ක්‍රියාත්මක විය. ලන්දේසින් විසින් ක්‍රමවත් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබූ බව ද දක්නට ලැබේ.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී අධිකරණ පද්ධතිය විධිමත් කිරීමට කටයුතු කරනු ලැබී ය. ඒ අනුව ලන්දේසීන් අප රටට හඳුන්වා දුන් රෝම ලන්දේසි නීතිය බ්‍රිතාන්‍ය අධිකරණ පද්ධතිය යටතේ ක්‍රියාත්මක විය. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළ ම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්තයේ රාජාධිකරණය වෙත අභියාචනා කළ හැකි විය. 1972 ඇති කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එම


බලය අහෝසි කරනු ලැබී ය. 1973 යුක්තිය පසිඳලීමේ පනතට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය ශ්‍රී ලංකාවේ ඉහළ ම උසාවිය ලෙස පිළිගත් අතර ඊට අමතර ව අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය හා මහේස්ත්‍රාත් අධිකරණය යන ආයතන ආරම්භ විය.

**ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාවේ නිදහසින් පසුව අධිකරණ පද්ධතියේ දක්නට ලැබුණු විශේෂ වෙනස්කම් අධ්‍යයනය කරන්න.

## ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා අධිකරණ සංවිධාන පනතට අනුව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන අධිකරණ පද්ධතිය පහත 2 රූප සටහනෙන් දැක්වේ.




1.2 රූපසටහන - ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ පද්ධතිය


ඉහත අධිකරණ පද්ධතියට අමතර ව ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනත් මඟින් අධිකරණ බලතල සහිත විනිශ්චය අධිකාරි හා ආයතන පිහිටුවා තිබේ. ඒ අනුව කාර්මික ආරවුල් විසඳීම සඳහා කම්කරු විනිශ්චය සභාව, මුස්ලිම් විවාහ ගැටලු විසඳීම සඳහා කාති උසාවි, ගෙවල් කුලී සම්බන්ධ ආරවුල් සඳහා ගෙවල් කුලී මණ්ඩලය වැනි

ආයතන දැකිය හැකි ය. වර්තමානයේ අධිකරණය වෙත යොමු නොවී ආරවුල් නිරාකරණය කර ගැනීමට සමථ මණ්ඩල ද පිහිටුවා ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතන පිළිබඳ ව මීළඟට අපි කෙටියෙන් විමසා බලමු.

**ශ්‍රේෂ්ඨාධිකරණය**

ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම අභියාචන අධිකරණ බලය සහිත උපරිමාධිකරණය ශ්‍රේෂ්ඨාධිරකරණය වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වන්නේ අග්‍ර විනිශ්චයකාරතුමා ය. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු සෙසු විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලය 1.3 රූප සටහනෙන් දක්වේ.





1.3 රූපසටහන - ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලය



1.2 රූපය - උපරිමාධිකරණ සංකීර්ණය

**අභියාචනාධිකරණය**


ශ්‍රේෂ්ඨාධිකරණයට අමතර ව පවතින ජ්‍යෙෂ්ඨතම අධිකරණ ආයතනය අභියාචනාධිකරණය ලෙස හැඳින්වේ. අභියාචනාධිකරණයේ ප්‍රධානියා වන්නේ අභියාචනාධිකරණ සභාපතිවරයා ය. අභියාචනාධිකරණය සඳහා විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත ජනාධිපතිවරයා සතු වේ. අභියාචනාධිකරණයට පහත සඳහන් අධිකරණ බලතල තිබේ.




1.4 රූප සටහන - අභියාචනාධිකරණයේ අධිකරණ බලය

## පළාත්බද මහාධිකරණය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පළාත්බද මහාධිකරණ පිහිටුවනු ලැබී ය. පළාත්බද මහාධිකරණය සඳහා විනිශ්චයකාරවරුන් අග විනිසුරු විසින් පත් කරනු ලැබේ. මෙමඟින් අභියාචනාධිකරණය සතු බලතල පළාත් මට්ටමින් විමධ්‍යගත කිරීම අරමුණු විය. ඒ ඒ පළාත්වල මහජනතාවට තමන්ගේ අභියාචනා පළාත් මට්ටමින් විසඳා ගැනීමට මෙමඟින් අවස්ථාව උදා වේ. පළාත් බද මහාධිකරණය සතු අධිකරණ බලය පහත රූප සටහනෙන් දැක්වේ.




1.5 රූප සටහන - පළාත්බද මහාධිකරණ බලය

## මහාධිකරණය

බරපතල අපරාධ සම්බන්ධ නඩු විසඳීමේ අධිකරණ බලය ද නාවුක අධිකරණ බලය හා වාණිජ අධිකරණ බලය ද මහාධිකරණය සතු වේ. මහාධිකරණය තුළ විභාග කළ හැකි වැරදි පහත රූප සටහනෙන් පෙන්වයි.

## මහාධිකරණය සතු අධිකරණ බලය

- බරපතල අපරාධ පිළිබඳ අධිකරණ බලය
  - මිනීමැරුම්
  - මිනීමැරීමට තැත් කිරීම
  - ස්ත්‍රී දූෂණ
  - රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ
  - විශාල මංකොල්ල
- අපහරණයට ලක් වූ දරුවෙකු නැවත භාර දීම හෝ එබඳු දරුවෙකු ලබා ගැනීම පිළිබඳ ඉල්ලුම් පත්‍ර
- නාවුක අධිකරණ බලය
- ශ්‍රී ලාංකිකයෙකු පිටරටක දී කරන ලද වරදක්
- ශ්‍රී ලංකා අහස් තීරයේ දී සිදු කරන වැරදි
- අධිකරණ සේවා කොමිෂන් සභා තීරණ විමර්ශනය කිරීම

**1.6 රූප සටහන - මහාධිකරණය සතු අධිකරණ බලය**

**දිසා අධිකරණය**

ශ්‍රී ලංකාවේ අධිකරණ දිස්ත්‍රික්ක 54ක දිසා අධිකරණ පිහිටුවා තිබේ. ඒ ඒ දිස්ත්‍රික්කවලට අදාළ සියලු ම සිවිල් නඩු සම්බන්ධ අධිකරණ බලය මෙම අධිකරණයන්ට අයත් වේ. දිසා විනිසුරුවරුන් පත් කිරීම හා ඉවත් කිරීම අධිකරණ සේවා කොමිසමෙන් සිදු කරනු ලබයි. දිසා අධිකරණවලට විසඳිය හැකි නඩු පහත දැක්වේ.

1. විවාහ සම්බන්ධ නඩු - (දික්කසාද, විවාහ ශූන්‍ය කිරීම, අනාචාරය සඳහා වන්දි ඉල්ලීම, දික්කසාද දීමනා ආදී)
2. තෙස්තමේන්තු නඩු - (අන්තිම කැමති පත්‍රයක් සහිතව හෝ රහිතව මිය ගිය පුද්ගලයන්ගේ බූදලයට අදාළ නඩු)
3. මානසික ආබාධවලින් පෙළෙන පුද්ගලයන් සඳහා භාරකරුවන් පත් කිරීම
4. බාල වයස්කරුවන්ගේ භාරකාරත්ව, සුජාතභාවය පිළිබඳ නඩු
5. දරුකමට හදා ගැනීම පිළිබඳ ඉල්ලීම්
6. උප්පැන්න සහතිකයේ නම වෙනස් කිරීම සඳහා කරන ඉල්ලීම්
7. ආදායම් පිළිබඳ නඩු
8. භාර හා වස්තු භංගත්ව පිළිබඳ නඩු

9. ගෙවීම්, ණය, අලාභ ඉල්ලීම් හා මුදල් නඩු

10. බෙදුම් නඩු

11. ඉඩම් නඩු

12. ගෙවල් කුලී නඩු

13. හදිසි අනතුරු වන්දි හා රක්ෂණ නඩු

14. සමාගම් පනත යටතේ පැවරෙන නඩු

**මහේස්ත්‍රාත් අධිකරණය**

ශ්‍රී ලංකාවේ අධිකරණ කොට්ඨාස 74ක් සඳහා මහේස්ත්‍රාත් උසාවි පිහිටුවා තිබේ. මුල් අවස්ථා අධිකරණ බලය මෙම අධිකරණවලට පැවරී තිබේ. මහේස්ත්‍රාත් අධිකරණයට රු. 1500කට නොඅඩු දඩයක් හෝ අවුරුදු 02ක බරපතල සිර දඬුවම් හෝ සුළු සිර දඬුවම් ලබා දිය හැකි ය. මහේස්ත්‍රාත් අධිකරණ සඳහා ද විනිසුරුවරුන් අධිකරණ සේවා කොමිසමෙන් පත් කරයි. මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවලට එරෙහි ව පළාත්බද මහාධිකරණයට අභියාචනා කළ හැකි ය.

- මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි
- යුද්ධ, ගුවන්, නාවික හමුද සම්බන්ධ වැරදි
- රජයේ සේවකයන් සම්බන්ධ වැරදි
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා අදාළ ආරක්ෂක ආඥා සඳහා වන ඉල්ලීම්
- මැතිවරණ සම්බන්ධ වැරදි
- බොරු සාක්ෂි දීම හා මහජන යුක්තියට එරෙහි වැරදි යන අධිකරණ බලයන් මහේස්ත්‍රාත් අධිකරණය සතු වේ.

මීට අමතර ව පාර්ලිමේන්තු පනත් මඟින් දක්වා ඇති වැරදි සම්බන්ධ ව ක්‍රියා කිරීමේ බලය ද මහේස්ත්‍රාත් අධිකරණය සතු ය.

උදා:- කැලෑ පනත, සුරා බදු පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, ආහාර පනත, මාර්ග සංවර්ධන අධිකාරී පනත හා මෝටර් රථ ප්‍රවාහන පනත

**ක්‍රියාකාරකම්**

- ඔබ ප්‍රදේශයේ ඇති අධිකරණ ආයතනයක් නිරීක්ෂණය කර එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙළ කරන්න.

## නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන්ගේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳ ව ඉහළ ම තලයේ සිටින ප්‍රධාන නිල හෙවත් භූමිකා තුනක් හඳුනා ගත හැකි ය. එනම් අධිකරණ අමාත්‍යවරයා, අග්‍ර විනිශ්චයකාරතුමා හා නීතිපතිතුමා වේ. මෙම නිලධාරීන්ගේ කාර්යභාරයන් මීළඟට විමසා බලමු.

**අධිකරණ අමාත්‍යතුමා**

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම මෙන් ම අධිකරණය සම්බන්ධ ව පාර්ලිමේන්තුවේ විමසන ප්‍රශ්න සඳහා පිළිතුරු දීමේ කාර්යය අධිකරණ ඇමතිතුමා සතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා වෙනත් පනත් අනුව පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට ද සාමදාන විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලය ද අධිකරණ ඇමතිවරයාට හිමි වී තිබේ.

**අග්‍ර විනිශ්චයකාරතුමා**

අග්‍ර විනිශ්චයකාරතුමා ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරිවරයා අධීක්ෂණය හා ඔහුගේ ලියාපදිංචි කාර්යාලය අධීක්ෂණය, විධානය හා පාලනය අග්‍ර විනිශ්චයකාරවරයා සතු වේ. අධිකරණ සේවා කොමිසමේ සභාපති වන්නේ ද අග විනිසුරු වේ. අධිකරණය සම්බන්ධ රීති සම්පාදනය කිරීමේ කාර්යය ද අග විනිසුරුතුමාගේ කාර්යයක් වේ. රීති සම්පාදනයේ දී තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් තුන් දෙනෙක් ඊට සහාය වේ. රීති සම්පාදනය කරන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.

- අභියාචනා භාර ගැනීම, විභාග කිරීම හා නිෂ්ප්‍රභා කිරීම
- ඇප දීම, නඩු කටයුතු නැවැත්වීම
- නීතිඥ වෘත්තිය හා සම්බන්ධ කටයුතු (උදා:- බඳවා ගැනීම්, ඉවත් කිරීම්, පිළිගැනීම්)
- ජූරි සභා සම්බන්ධ කටයුතු
- පිස්කල් නිලධාරීන් හා එම කාර්යයන් සම්බන්ධ කටයුතු
- අධිකරණ සම්බන්ධ රීති සංශෝධනය, වෙනස් කිරීම හා නව රීති පැනවීම


**නීතිපතිතුමා**

1883 අංක 01 දරන ආඥා පනතට අනුව වර්තමාන නීතිපති තනතුර පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන නීතිපතිතුමා, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ද නීතිපතිතුමා ය. නීතිපතිතුමාගේ බලතල හා කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

1. මහාධිකරණය මගින් පමණක් විභාග කළ හැකි නඩුවල දී ඉදිරියෙන් ම ඇති සාක්ෂි හා වෙනත් කරුණු මත සමාව දීමේ බලය.
2. ඇතැම් නඩු, අපරාධ අධිකරණයක ගොනු කිරීමට අනුමැතිය ලබා දීමේ බලය.
3. රජයේ දෙපාර්තමේන්තු නිලධාරීන් අවශ්‍ය අවස්ථාවල දී සිය කාර්යාලයට කැඳවීමට හා ඔවුන්ට අවශ්‍ය උපදෙස් දීමේ බලය.
4. මහජනතාවට අසාධාරණ ලෙස සලකන, යුක්තිය ඉටු කිරීමට මැලිවන හෝ පැහැර හරින රජයේ සේවකයන්ට එරෙහි ව නීතිමය පියවර ගැනීමේ බලය.
5. ඇමතිවරයකුට, ලේකම්වරයකුට හෝ රජයේ නිලධාරියකුට නඩුවක් ගොනු කිරීමට ප්‍රථම නීතිපතිවරයාට දැන්වීම.
6. නීතිපතිතුමා වෙත පැවරී ඇති වගකීම් සිය නියෝජිතයන්ට පැවරීමේ බලය.
7. ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට විත්තිකරුවන් නිදහස් කිරීමේ බලය.
8. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන ලෙස වගබලා ගැනීමේ බලය.


## නීතිපතිතුමාගේ කාර්යයන්

ඉන් කිහිපයක් පහත රූප සටහනෙන් දැක්වේ.




1.7 රූප සටහන - නීතිපතිතුමාගේ කාර්යයන්

නීතිපතිතුමාගේ බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා සහාය වන නිලධාරීන් කිහිප දෙනෙක් ද වේ.




1.8 රූපසටහන - **නීතිපතිතුමා සතු බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා සහාය වන නිලධාරීන්**

**ක්‍රියාකාරකම්**

- අධිකරණ ඇමතිතුමා, අගවිනිසුරුතුමා හා නීතිපතිතුමාගේ ඉටු කරනු ලබන කාර්යයන් ඇගයීමට ලක් කරමින් ප්‍රායෝගිකව ලිපියක් සකස් කරන්න.


## ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම

යම් ගැටලු අවස්ථාවක දී මීට පෙර සඳහන් කළ අධිකරණවලට යොමු වීමට පෙර පුද්ගලයන්ට ඒවා විසඳා ගැනීම සඳහා විකල්ප ක්‍රම රැසක් වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇත. එමඟින් පුද්ගලයන්ගේ කාලය, ශ්‍රමය, මුදල් ඉතිරි කරගත හැකිය. එමෙන් ම ඉක්මනින් දෙපාර්ශ්වයට ම එකඟ විය හැකි විසඳුමක් ලබා ගැනීමට ද හැකියාව ලැබේ. එබඳු විකල්ප ක්‍රම කිහිපයක් මීළඟට සාකච්ඡා කරමු.

**බේරුම්කරණය**

සේවක හා සේවායෝජක කණ්ඩායම් අතර ඇතිවන වෘත්තිමය ආරවුල් එම ආයතනයේ මෙන් ම රටේ පැවැත්මට ද හානි සිදු කරයි. එබැවින් එවැනි ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීමට කටයුතු කිරීම බේරුම්කරණය ලෙස හැඳින්වේ. ඒ සඳහා 1950 කාර්මික ආරවුල් පනත, සමථ මණ්ඩල පනත වැනි නීති උපයෝගී කරගත හැකි ය.

බේරුම්කරණය සිදුවන ආකාරය අනුව කොටස් දෙකකට වර්ග කළ හැකි ය.




1.9 රූපසටහන - බේරුම්කරණ ක්‍රම

මෙහි දී බේරුම්කරු යනු ආරවුලට සම්බන්ධ පාර්ශ්ව දෙක සමඟ සාකච්ඡා කොට ආරවුල විසඳීමට කටයුතු කරන පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් වේ.

බේරුම්කරණයේ දී ආරවුල පිළිබඳ වාර්තාවක් කම්කරු කොමසාරිස් විසින් බේරුම්කරුට ලබා දේ. බේරුම්කරු විසින් ආරවුල සම්බන්ධ විභාගයක් පවත්වන අතර එය සාධාරණ කාලයක් තුළ නිම කිරීම අවශ්‍ය වේ. ආරවුලට සම්බන්ධ වෙනත් පාර්ශව සිටී නම් ඒ අය ද විභාගය සඳහා සහභාගි කරවා ගත හැකි ය. දෙපාර්ශ්වයේම අදහස් විමසීමෙන් අනතුරුව තීන්දුව ලබා දීම සිදු වේ. එම තීන්දුව කම්කරු කොමසාරිස්වරයා විසින් ගැසට් කර නීත්‍යානුකූල බව ලබා දීම අවශ්‍යය. එම තීන්දුව ප්‍රතික්ෂේප කිරීමට ද පාර්ශ්වකරුවන්ට අයිතිය තිබේ.

**ඔම්බුඩ්ස්මන්වරයා**

විධායක සහ පරිපාලන ක්‍රියා මඟින් පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා සෙසු අයිතිවාසිකම් කඩවන අවස්ථාවල දී ඒවා ආරක්ෂා කර දීම සඳහා රජය ගෙන ඇති එක් ක්‍රියා මාර්ගයක් ලෙස ඔම්බුඩ්ස්මන් හෙවත් පරිපාලනය පිළිබඳ විශේෂ කොමසාරිස් තනතුර දක්වීමට පුළුවන.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ඔම්බුඩ්ස්මන් තනතුර ඇති කරන ලදි. ශ්‍රී ලංකාවේ ඔම්බුඩ්ස්මන්වරයාගෙන් ප්‍රධාන කාර්යයන් දෙකක් අපේක්ෂා කරයි.

I. සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැළැක්වීම.

II. සියලු පරිපාලන අසාධාරණයන්ගෙන් පුරවැසියා ආරක්ෂා කිරීම.

ඔම්බුඩ්ස්මන් හෙවත් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ජනාධිපති විසින් පත් කරනු ලබන අතර යථා පැවැත්මෙන් සිටින තාක් කල් එම ධුරය දැරිය හැකි ය. ඉන් එම තනතුරේ ස්වාධීනත්වය ආරක්ෂා වී තිබේ. ඔම්බුඩ්ස්මන්වරයාගේ වැටුප ඒකාබද්ධ අරමුදලෙන් ගෙවන අතර එය අඩු කළ නොහැකිය. ඔම්බුඩ්ස්මන්වරයා ඉවත් කිරීම පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් පසුව ජනාධිපතිවරයාට කළ හැකි වේ. 1994න් පසු ශ්‍රී ලංකාවේ ඕනෑ ම පුරවැසියෙකුට සිය පැමිණිල්ල සෘජු ව ඔම්බුඩ්ස්මන්-වරයාට ඉදිරිපත් කළ හැකිවීම විශේෂ ලක්ෂණයකි.

**ක්‍රියාකාරකම්**

- ඔබ ප්‍රදේශයේ ආරවුල් බේරීම සඳහා ක්‍රියා කරන සමථ මණ්ඩලයක සිදුවන ක්‍රියා පටිපාටිය පිළිබඳ තොරතුරු රැස් කර වාර්තාවක් පිළියෙළ කරන්න. සමථ මණ්ඩලයක ඇති වාසි හා අවාසි ද සඳහන් කරන්න.

## මානව හිමිකම් කොමිසම

යම් පුද්ගලයෙකුට තමන්ගේ මානව හිමිකම් ආරක්ෂා කර ගැනීමට අයිතියක් තිබේ. ඒ පිළිබඳ ව මානව හිමිකම් හා යුතුකම් පාඩමේ දීර්ඝ ව විස්තර කර ඇත. යම් පුද්ගලයෙකුගේ මානව හිමිකම් කඩවීමක් පිළිබඳ ව මානව හිමිකම් කොමිසමට පැමිණිලි කර සහනයක් ලබා ගත හැකි ය. 1996 අංක 21 දරන පනත මඟින් මානව හිමිකම් කොමිසම පිහිටුවා තිබේ. කොමිසමේ සාමාජිකයන් ජනාධිපති විසින් පත් කරනු ලබන අතර එය විසි දෙනෙකුගෙන් සමන්විත වේ.

**මානව හිමිකම් කොමිසමේ ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.**

1. මානව හිමිකම් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම.
2. මූලික අයිතිවාසිකම් සම්බන්ධව ආණ්ඩුවට උපදෙස් ලබා දීම.
3. මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විභාග කිරීම හා විසඳුම් ලබා දීම
4. මානව හිමිකම් සුරක්ෂිත වීම පිණිස විධායක හා පරිපාලන පිළිවෙත් හා කාර්යයන් පිළිබඳ සුපරික්ෂාකාරී වීම.
5. ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට අනුව ජාතික නීති හා පරිපාලන පිළිවෙත් සැකසීමට ආණ්ඩුවට උපදෙස් ලබා දීම.
6. මානව හිමිකම්වලට අදළ ජාත්‍යන්තර ගිවිසුම්වලට එකඟවීමේ අවශ්‍යතාව පිළිබඳ ආණ්ඩුවට උපදෙස් දීම.

මානව හිමිකම් කොමිසම සතු බලතල කිහිපයක් ද හඳුනා ගත හැකි ය.

- මානව හිමිකම් උල්ලංඝනයවීම් විමර්ශනය කිරීම හා අධිකරණ කටයුතුවලට මැදිහත් වීම
- මානව හිමිකම් පිළිබඳ පළාත් සභා මට්ටමේ උප කමිටු පිහිටුවීම
- අධිකරණ හෝ වෙනත් ආකාරයකින් රඳවා ගෙන සිටින්නන් පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම
- මානව හිමිකම් ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම
- මානව හිමිකම් කඩවීමකට ලක්වූවෙකුට ඒ සඳහා සාධාරණ ප්‍රදානයක් ලබා දීම

උපදේශනය හා සමථකරණය යනු ආරවුල් බේරුම්කරණය සඳහා අනුගමනය කරනු ලබන තවත් ක්‍රමවේද දෙකකි වේ. මෙම ක්‍රමවේද 10 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම මාතෘකාව යටතේ (පිටු අංක 102 හා 105) සාකච්ඡා කර ඇති බැවින් මෙහි දී විස්තර කරනු නොලැබේ.


**ක්‍රියාකාරකම්**

- ආරවුල් බේරුම් කිරීමට විකල්ප ක්‍රම අනුගමනය කිරීම තුළින් පුද්ගලයන්ට, ආයතනයට හා පොදුවේ සමාජයට ඇතිවන වාසි වෙන් වෙන්ව සඳහන් කරන්න.

## නීතියේ ආධිපත්‍යය

නීතියේ ආධිපත්‍යය යනු රටක පාලනය නීතියේ උත්තරීතරභාවයට අනුව සිදු කිරීම වේ. එහි දී සමාජයේ සෑම පුද්ගලයෙක් ම, ආයතනයක් ම නීතියට යටත් ව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. නීතිය ඉදිරියේ සියලු දෙනා ම සමාන වන අතර නීතිය සර්ව සාධාරණ රැකවරණයට හිමිකම් ලබයි. ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය වන අතර එයට අනුකූල ව කටයුතු කිරීමට අප සියලු දෙනා ම බැඳී සිටී.

එසේ ම ජී. මාර්ෂල් විසින් ද නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග තුනක් දක්වා ඇත.




1.10 රූපසටහන - නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග

ඉහත ගුණාංග අනුව නීතියේ ආධිපත්‍යය තුළ තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳ ව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම
- නීතිය නොදැන සිටීම නිදහසට කාරණයක් ලෙස නොසැලකීම
- සාධාරණ ව හා අප්‍රමාද ව යුක්තිය පසිඳලීම
- පුද්ගලයන්ගේ තරාතිරම රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක නොවීම
- නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොවීම

නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම තුළින් පුද්ගලයන්ට සිදුවිය හැකි අගතිගාමී තත්ත්වයන් අවම කරගෙන රට තුළ සාධාරණ හා යුක්ති සහගත සමාජයක් බිහි කළ හැකි වනු ඇත.

## අධිකරණයේ ස්වාධීනත්වය



1.3 රූපය - ඇතීනා දෙවඟන

වර්තමාන සමාජය තුළ අධිකරණයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. එයට හේතුව ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ පුරවැසියන්ගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, යුක්තිය හා සාධාරණත්වය සැලසීමටත් අධිකරණයට ප්‍රමුඛස්ථානයක් ලැබීමයි.

අධිකරණය ස්වාධීන හා අපක්ෂපාතී වන විට පුද්ගලයන් තුළ අධිකරණය කෙරෙහි විශ්වාසයක් ඇතිවේ. එවැනි තත්ත්වයක් තුළ නීතියට ගරු කරමින් නීතියට අනුව ජීවත්වීමට පුද්ගලයෝ පෙළඹෙති. ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රතිපාදන සලසා ඇත. ඇතීනා දෙවඟන අධිකරණ කටයුතු සඳහා ලාංඡනයක් ලෙස යොදා ගැනීමෙන් නීතිය සැමට සාධාරණ ව අපක්ෂපාතී ව හා මධ්‍යස්ථ ව ක්‍රියා කරන බව ප්‍රකාශ වේ. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන කිහිපයක් පහත සාකච්ඡා කෙරේ.

- **විනිශ්චයකාරවරුන් පත් කිරීම**

ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත් ව ජනාධිපතිවරයා විසින් ද පහළ අධිකරණවල විනිසුරුවන් පත් කිරීම අධිකරණ සේවා කොමිසන් සභාව විසින් ද සිදු කරනු ලබයි. ඒ ඒ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස නිශ්චිත ව දක්වා ඔවුන් යථා පැවැත්මෙන් සිටින තාක් කල් ධුර දරන අතර ඊට පෙර එම ධුරයෙන් ඉවත් කිරීමට ද නොහැකි වේ. මේ තුළින් අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමට බලාපොරොත්තු වේ.

- **විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම**

අධිකරණයේ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම සඳහා විශේෂිත ක්‍රියාවලියක් යෝජනා කර තිබේ. ඒ තුළින් ද බලාපොරොත්තු වන්නේ ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාව ඇති කිරීමයි. එවිට ඔවුන්ට ස්වාධීන ව හා අපක්ෂපාතී ව තම තීන්දු ලබා දීමට හැකියාව ලැබේ.

- **විනිශ්චයකාරවරුන්ගේ වැටුප්**

විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලක් මඟින් ගෙවීම ද අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගන්නා ලද තවත් ක්‍රියාමාර්ගයක් වේ. ඒ අනුව අයවැය මඟින්

අධිකරණය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ අවස්ථාව අහිමි කර තිබේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ වැටුප් පාර්ලිමේන්තුව මඟින් තීරණය කරනු ලැබේ. එසේ ම විනිශ්චයකාරවරයකුගේ වැටුප හෝ විශ්‍රාම හිමිකම් කිසිම හේතුවක් නිසා අඩු කිරීමට ද නොහැකි වේ.

■ **වෙනත් තනතුරු පිළිගැනීම**

ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ට ජනාධිපතිගේ අවසරයකින් තොරව වැටුප් ලබන හෝ නොලබන කිසිම තනතුරක් පිළිගැනීම හෝ දැරීම නොකළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම දක්වා ඇත. එසේ ම ඔවුන් විශ්‍රාම යාමෙන් පසුව වුව ද වෙනත් වෘත්තියක නියැලීම නොකළ යුතු බව ප්‍රකාශ වේ. එමඟින් ද විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය ඇති කිරීමත් අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමත් බලාපොරොත්තු වේ.

■ **අනවශ්‍ය මැදිහත්වීම් හා පාලනය කිරීම් සීමා කිරීම**

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා අධිකරණ කටයුතුවලට බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කර තිබේ. කිසිම බලපෑමකට යටත් නොවී තම තනතුරේ කාර්යයන් ඉටු කිරීමට ඉන් විනිසුරුවරුන්ට ඉඩ සැලසේ.

■ **අධිකරණ සේවා කොමිසම පිහිටුවීම**

අධිකරණ සේවා කොමිසම පිහිටුවීම ද අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයක් ලෙස දැක්විය හැකි ය. අග විනිසුරුතුමා සභාපති වන අතර තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනෙක් මෙහි සාමාජිකයෝ වෙති. ජනාධිපති විසින් අවුරුදු 05ක ධුර කාලයක් සඳහා මෙම සාමාජිකයන් පත් කරනු ලැබේ. **අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයෙකු ඉවත් කළ හැක්කේ හේතු දැක්වීමෙන් පසුව බවට විශේෂ වගන්තියක් ඇතුළත් කර ඇත.** එමඟින් ජනාධිපතිවරයාට පවා මෙම කොමිසමේ කටයුතුවලට බලපෑම් කිරීමට ඇති අවස්ථා අහිමි කර තිබේ.

**ක්‍රියාකාරකම්**

- අධිකරණය ස්වාධීන විය යුතු යැයි සිතන්නේ ද? ඒ සඳහා හේතු 5ක් දක්වන්න.

## අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ අධිකරණවල විභාග වන නඩු අවසන් වීමට බොහෝ කාලයක් ගත වන බව නිතර අසන්නට ලැබේ. එවිට පුරවැසියන් තුළ නීතිය හා අධිකරණය කෙරෙහි පවතින විශ්වාසය පළුදු වීමට ඉඩ ඇත. නීතියේ අඩුපාඩු හෝ යුක්තිය පසිඳලීම ප්‍රමාද වීම නිසා අගතියට පත් පුද්ගලයන්ට අසාධාරණයක් සිදු විය හැකි ය.

අප්‍රමාද ව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇති විය හැකි අවාසිදායක තත්ත්වයන් කිහිපයක් පහත දැක්වේ.

- පුද්ගලයන් තුළ අධිකරණ පද්ධතිය හා නීතිය පිළිබඳ විශ්වාසයක් නොමැති වීම
- නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම
- රට තුළ සිදුවන අපරාධ හා දූෂණ වර්ධනය වීම
- රට තුළ නීතියේ සමානතාව හා සාධාරණත්වය පිරිහීම
- යුක්තිය ඉටු කර ගැනීම සඳහා අනියම් ක්‍රම භාවිතයට පෙළඹීම
- යුක්තිය ඉටු කර ගැනීම සඳහා විශාල කාලයක් ශ්‍රමයක් හා මුදලක් වැය කිරීමට සිදුවීම
- මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය හීන වීම

ඉහත තත්ත්වයන් අවම කරගෙන රට තුළ සාධාරණ හා අපක්ෂපාතී ව කටයුතු කරමින් යහපාලනයක් කරා ගමන් කිරීමට නම් අධිකරණයේ ස්වාධීනත්වයත්, සාධාරණව හා ඉක්මනින් යුක්තිය පසිඳලීමත් අවශ්‍ය වේ.

එසේ ම පුරවැසියන්ගේ යුතුකම වන්නේ රටේ පවතින නීතියට හා අධිකරණ පද්ධතියට ගරු කරමින් සාමකාමී හා සාධාරණ ව කටයුතු කිරීමයි. නීතිය සාමකාමී හා යුක්තිගරුක සමාජයන් ආරක්ෂා කරන උපකරණයක් බැවින් සෑම පුරවැසියෙක් ම නීතියට අවනත වීම වැදගත් වේ.

### ක්‍රියාකාරකම්

- ඔබ නීතිගරුක පුරවැසියෙකු ලෙස ජීවත්වීමේ ඇති වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.